**මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතිය - 2018**

---

මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව (ADB) අතර ඇති කරගත් 2016 ජුනි 07 දිනැති ණය ගිවිසුම් අංක 2624 හි (IV) වන ව්‍යවස්ථාවේ 4.05(අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සැපයීම හා ව්‍යාපෘති කාල සීමාව**

---

ණය ගිවිසුම අනුව, එවකට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ මුදල් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ණය ගැනුම්කරුවාගේ මූල්‍ය ඉඩකඩ හා රාජ්‍ය මුදල් කළමනාකරණ පද්ධතියෙහි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත පිරිවැය එ.ජ.ඩො. මිලියන 40.8 කට සමාන රු.මිලියන 5,344 ක් වූ අතර ඉන් එ.ජ.ඩො. මිලියන 30.8 කට සමාන රු.මිලියන 4,034.8 ක්, ආසියානු සංවර්ධන බැංකුව මගින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. රු.මිලියන 10.00 ක ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යයනය කිරීමට අපේක්ෂිතය. ව්‍යාපෘතියේ කටයුතු 2010 මැයි 01 වන දින ආරම්භ කරන ලද අතර එය 2013 ඔක්තෝබර් 31 වන විට නිමකිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියෙහි කටයුතු අවසන් කිරීමේ දිනය 2018 ඔක්තෝබර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

---

මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතියෙහි 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණු වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක

අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැලසීම, චේතනාන්විත මග හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇති වීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. භෞතික කාර්යසාධනය
-------------------------

### 2.1 ව්‍යාපෘතියෙහි කටයුතුවල භෞතික ප්‍රගතිය
--------------------------------------------

ව්‍යාපෘතියේ කටයුතු, ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපනය කිරීම හා ධාරිතා සංවර්ධනය යන සංරචකයන් දෙක යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. පහත සඳහන් නිරීක්ෂණ කරනු ලබයි.

| සංරචකය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ ප්‍රතිචාරය | නිර්දේශ |
|---|---|---|---|---|
| ------------- | ------------ | ---------- | ---------------------- | --------------- |
| ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය | ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය නිර්මාණය කිරීම, ස්ථාපනය කිරීම හා මෙහෙයවීම සඳහා | වැඩ නිම කිරීම සඳහා අමතර අරමුදල් ශ්‍රී ලංකා රජය වෙතින් ප්‍රතිපාදනය කළ යුතුය. | මුදල් අමාත්‍යාංශය විසින් මෙම පද්ධතිය දැඩි විශේෂීකරණයන් සඳහා ඉල්ලීම් කර තිබීම, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් පද්ධතියට සිදුවන | පද්ධතියෙහි වැරදි නිවැරදි කිරීමට හා පද්ධතිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල පුහුණුව |

| | | | |
|---|---|---|---|
| වන කොන්ත්‍රාත්තුව යටතේ වූ ක්‍රියාකාරකම් 2016 ජනවාරි 13 වන විට නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, රාජ්‍ය වියදම් දරන ආයතනවල තොරතුරු මහා භාණ්ඩාගාරය සමඟ හුවමාරු කර ගැනීමට මෙම තොරතුරු පද්ධතිය 2018 දෙසැම්බර් 31 දිනටද ක්‍රියාත්මක නොවීය. | | මන්දගාමී අනුවර්තනය හා පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී කොන්ත්‍රාත්කරුවන් මගින් සිදු වූ ප්‍රමාදයන් වැනි හේතූන් ප්‍රමාදයන් ඇති කර තිබුණි. | ලබාදීමට ඉක්මන් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2.2 ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය | නිර්දේශ |
|---|---|---|---|
| රු.මිලියන 186.53 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද හා රාජ්‍ය වියදම් දරන ආයතනවලට බෙදාහරින ලද පරිගණක 1,000 ක් අපේක්ෂිත කටයුතු සඳහා භාවිතා නොකරන ලද බව නිරීක්ෂණය විය. | වෙනත් කටයුතු සඳහා භාවිතා කිරීමට ඇති හැකියාව, අවභාවිතය හා හානි. | කිසිදු අදහස් දැක්වීමක් ලැබී නොතිබුණි. | ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද වත්කම් අපේක්ෂිත කටයුතු සඳහා භාවිතා කළ යුතුය. තවද, පාඩු අවම කර ගැනීමට වගකීම් සහතික ලබාදෙන කාලසීමාව සංශෝධනය කළ යුතුය. |